දිනමිණ සිළුමිණ The Silumina epaper

CHANNEL Eye

# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ "ප්‍රධාන ගණකාධිකාරී (Chief Accountant)" තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැටුප් කාණ්ඩය:** HM 1-1 (ජ්‍යෙෂ්ඨ කළමනාකාර)

**සුදුසුකම්** : (පහත සඳහන් 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණය, කළමනාකරණය, මූල්‍ය, වාණිජවේදී, ක්ෂේත්‍රයන්ට අදාළව උපාධියක්

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

   **සහ**

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ"** මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

   **සහ**

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ"** මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : HM 1-1-2016 - රු. 80,295 - 15X2,270 - 114,345/-

**සෙසු දීමනා** : ජීවන වියදම් දීමනාව, වෘත්තීය දීමනාව, පැමිණීමේ දිරි දීමනාව හා අනුමත වෙනත් දීමනා, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට හිමි ප්‍රවාහන හා ඉන්ධන දීමනා, වෛද්‍ය රක්ෂණ පහසුකම් සහ වෙනත් ප්‍රතිලාභ.

**පොදු :**

මෙම තනතුර සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාර අරමුදල් හිමිකම් සහිත ස්ථිර තනතුරකි. අයදුම්කරුවන් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවාගනු ලැබේ. අයදුම්පත් **2024.03.18** දිනට පෙර තනතුරේ නම සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ **ddgaslrc@gmail.com** යන විද්‍යුත් ලිපිනයට හෝ එවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**
**නිදහස් චතුරශ්‍රය**
**කොළඹ 07.**

**දුරකථන අංකය: 011-2698187**
**වෙබ් අඩවිය : www.rupavahini.lk**
2024.02.29